සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

RICHMOND COLLEGE LIB...
GALLE

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 8 ශ්‍රේණිය
## සිංහල භාෂාව හා සාහිත්‍යය

**නම/විභාග අංකය :-** ........................................................................................ **කාලය : පැය 02 යි.**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
  නිවැරදි පිළිතුර තෝරා ඉරක් අඳින්න.
  I කොටසේ ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයා II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.

I කොටස

(1) පහත සඳහන් ප්‍රකාශ අතුරින් ප්‍රස්තාව පිරුළක් වන්නේ,

(1) ඉහේ මලක් පිපුණා (2) ගමරාලගේ වංගෙඩිය වාගේ
(3) තරු පෙනුණා (4) පොර කටු ගෙවිලා

(2) මහාප්‍රාණ අක්ෂර ඇතුළත් පද පේළිය වන්නේ,

(1) ධනය, සාකච්ඡාව, ප්‍රෞඪ, ප්‍රතිඵල (2) පාඨශාලාව, මර්දනය, වර්ධනය, ආබරණ
(3) නිදාන, ප්‍රාර්ථනා, මූර්ධජ, ස්තූපය (4) ණය, පාෂාණ, ප්‍රමුඛ, ඖෂධ

(3) අක්ෂර වින්‍යාසය නිවැරදිව යොදා ඇති පද පේළිය තෝරන්න.

(1) පරිගණකය, දූෂනය, නිෂ්පල, ආඛ්‍යාතය (2) දූෂණය, ගණකාධිකාරී, ලක්ෂණ, අක්ෂරය
(3) විවාලේය, ඖෂධ, තික්ෂන, පරික්ෂන (4) තුරු පෙල, චන්දය, විශිෂ්ඨ, නවීකරණය

(4) පහත සඳහන් පාඨ අතුරින් ආශිර්වාද ක්‍රියාපද ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) දෙවු මෙහෙසුන්, විහිෂණ, දෙව්දූට පවර (2) ඔන්න මලේ ඔය නාමල නෙළා වරෙන්
(3) වහසි බස් නොදොඩව (4) ගව්වෙන් ගව්ව දිව මාලිග සැදේවා

(5) අකාරාදී පිළිවෙළට සකසා ඇති පද පේළිය වන්නේ,

(1) ඉරිදා, සඳුදා, අඟහරුවාදා, බදාදා, බ්‍රහස්පතින්දා
(2) ගාල්ල, මාතර, රත්නපුරය, වැලිගම, හම්බන්තොට
(3) අල, බතල, මයියොක්කා, කිරිඅල, රතල
(4) ගොටුකොළ, කංකුං, මුකුණුවැන්න, කතුරුමුරුංගා, සාරණ

(6) නාම පද බෙදිය හැකි කොටස් ගණන

(1) 3 (2) 4 (3) 2 (4) 5

(7) ජාති නාම පමණක් ඇතුළත් පද පේළිය වන්නේ,

(1) මිනිස්, දෙවි, සිංහ, පොල් (2) පස්, ගල්, පොත්, වාහන
(3) නිමල්, ගාල්ල, ඉන්දියාව, සිරිසේන (4) කියමන්, ලියුම්, නරඹන, කෙරුම්

(8) පහත සඳහන් පද අතුරින් තද්ධිත පදයක් සහ සමාස පදයක් ඇතුළත් වන්නේ,

(1) නුඹලා, නිමල් (2) බුද්ධිමත්, කිරිබත් (3) රන්මුවා, බලවත් (4) ලියුම්, සියපත්

(9) පහත සඳහන් වාක්‍ය අතුරින් විශේෂණ පද ඇතුළත් වාක්‍ය වන්නේ,

(1) අපේ නංගී ඇඬුවාය. (2) කළු බල්ලා වේගයෙන් දුවයි.

(3) ළමයි සරුංගල් යවති. (4) අම්මා බත් ඉව්වාය.

(10) "වත" යන්නට බහු අර්ථ ඇතුළත් පද පේළිය වන්නේ,

(1) මුහුණ, කාන්තාව, චන්ද්‍රයා, වස්තුව (2) කාලය, වස්ත්‍ර, ශාස්ත්‍රය, ව්‍රතය

(3) ව්‍රතය, විස්තරය, මුහුණ, වස්ත්‍ර (4) විස්තරය, යහපත්, උතුම්, කත

- **පහත සඳහන් වාක්‍ය සම්පූර්ණ කිරීම සඳහා සුදුසු පදය තෝරන්න.**

(11) .................................................................. කුඹුර වපුරති. (ගොවීන්, ගොවියෝ, ගොවියා)

(12) අපි දෙමාපියන්ට ගරු .................................................................. (කළහ, කළෙමු, කළෙහු)

(13) .................................................................. හොඳින් ඉගෙන ගනිමි (මා, මම, අපි)

(14) අපේ තාත්තා වැඩට .................................................................. (ගියේය, ගියාය, ගියෝය)

(15) නුඹලා ක්‍රීඩා පිටියට .................................................................. (ගියෙහු, ගියෙහි, ගියහ)

(16) "තුරු" යන්නට සමාන පදයක් නොවන්නේ,

(1) ගස (2) රුක (3) දර (4) වෘක්ෂය

(17) "උත්තම" යන්නෙහි විරුද්ධ පදය වන්නේ,

(1) උසස් (2) උතුම් (3) අධම (4) වටිනා

(18) මධ්‍යම පුරුෂයට අයත් ක්‍රියා පදයක් වන්නේ,

(1) කළෙහු (2) කළෙම් (3) කරති (4) කරයි

(19) පහත සඳහන් නාම පද අතුරින් සර්ව නාම පදයක් වන්නේ,

(1) පොත් (2) මිනිස් (3) අපි (4) වාහන

(20) 'ආවර්ණ කල්පිත' යන්නෙහි අදහස වන්නේ,

(1) කල්පයක් (2) ඉතාම පැරණි (3) ඉපැරණි යුගයට අයත් (4) සැමදා පවතින

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

(1) පන්ති කාමර ඇගයීමක් ලෙස "ගුණදාස අමරසේකර මහතාගේ කෙටිකතාවක් රස විඳිමු" යන තේමාව යටතේ ලිපියක් සකස් කිරීමට ඔබ කණ්ඩායමට පැවරුණේ යයි සිතන්න.

(i) මෙම ලිපිය සකස් කිරීමට ගුරුභවතාගෙන් ඔබට ලැබුණු උපදෙස් දෙකක් ලියන්න.

(ii) මෙම නිර්මාණය සඳහා ඔබ විසින් සකස් කරන ලද මාතෘකාව කුමක් ද?

(iii) ඔබ තෝරා ගත් කෙටිකතාවේ නම සහ මෙම නිර්මාණකරුගේ වෙනත් කෙටිකතාවක නමක් ද ලියන්න.

(iv) ගුණදාස අමරසේකර මහතාගේ උපන් ගම හා ඔහුගේ වෘත්තිය සඳහන් කරන්න.

(v) ඔබ තෝරා ගත් කෙටිකතාවෙහි ඇතුළත් චරිත දෙකක් නම් කරන්න.

(ලකුණු 2 × 5 = 10යි)

(2) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 150කට නො අඩු රචනයක් ලියන්න.

(i) ජාතික නිදහස් දිනය සමරමු.

(ii) පොතපතින් දැනුම ලබමු.

(iii) අනාගතයට පැළයක් සිටවමු.

(iv) සුන්දර ළමා ලෝකයේ මතක සටහන්

(v) වසවිසෙන් තොර ආහාර

(ලකුණු 20)

(3) නියඟයෙන් පසු ඇති වූ වර්ෂාවත් සමඟ ප්‍රදේශය තුළ ඩෙංගු ව්‍යසනයට ගොදුරු වන රෝගීන් සංඛ්‍යාව වැඩි වී ඇත. ඩෙංගු රෝගයෙන් වැළකීම සඳහා ගත හැකි පියවර පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම සඳහා සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න. ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක චරිත වික්‍රමනායක ඔබ යැයි සිතන්න. (ලකුණු 10යි)

(4) පහත දැක්වෙන කවි පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එළිය දුටුව දින සිට මං දිව යනවා
ගස් අතු උඩින් පනිමින් සෙල්ලම් වෙනවා
මා සොයුරා සමඟින් දොඩමළු වෙනවා
ටිං නද සමඟ අප දෙදෙනා රඟ දෙනවා

මව් උකුලට තුරුළුව කිරි බී දෙන්නා
රණ්ඩු දබර වී මවගෙන් දිව දෙන්නා
එකින් එකා පසුපස නිති ලුහු බඳිනා
අතු මත වැටී පෙරළී කාලය ගෙවනා

මව්කිරි සොයා සිහි වන විට පැමිණෙනවා
කිරි බී වැඩී සුරතල් 'ටිං' නද දෙනවා
දුව පනිමින් කාලය නිති ඉගිලෙනවා
සොයුරා සමඟ මා වැඩෙමින් කල් ගෙවනා

දිනයක් පැමිණි බව නොදනිමි නුදුරු දින
සොයුරා සමඟ මා දබරව සිටින දින
අතු මත පැටලෙමින් දිව යන විට සැණින
අතු බර වෙමින් ගස පාමුල බිම වැටින

වැටෙමින් නැගිටිමින් දුවනට තැත් කෙරුවා
මා සොයුරා බිය වී නිති හඬ ගැවා
මා ඔසවන්න ඔහු හට වෙර නැති වූවා
බදමින් පොළොව මම නිති කෙඳිරිලි ගැවා

(i) මෙම කවි පෙළෙන් කියැවෙන්නේ කවරකු ගැන ද?
(ii) මොවුන් සෙල්ලම් කරන්නේ කුමක් දුටු විට ද?
(iii) එක් පැටියෙකු බිමට වැටුණේ කුමක් නිසාද?
(iv) එවිට අනෙකා කුමක් කළේ ද?
(v) සමාන පද කවි පන්තියෙන් තෝරා ලියන්න.
(අ) ශක්තිය
(ආ) නිතර

(ලකුණු 2 × 5 = 10)

(5) පෙළ පොත ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) "අපේ පැතුම් අහසට විහිදී යයි.
කම්හල්වල දුම් වළලු දිගේ"
(අ) මෙම ගීත ඛණ්ඩයෙහි ඉතිරි දෙපදය සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි නිර්මාණකරු නම් කරන්න.

(ii) "එහෙනම් ඒක ගන්න හැදුවේ? පලයන් යන්න"
(අ) මෙම ප්‍රකාශය කාගේ ද?
(ආ) මෙම ප්‍රකාශය කළේ කා හට ද?

(iii) "හඳ හාමි අප දිහාව
එබී බලයි පා හිනාව"
(අ) ඉහත පද්‍ය කොටස ඇතුළත් පාඩම කුමක් ද?
(ආ) මෙම කවියා ළමයින් උදෙසා රචනා කරන ලද කාව්‍ය ග්‍රන්ථයක් නම් කරන්න.

(iv) "ඔබ දූනටමත් මට ප්‍රත්‍යුපකාර කර අවසන්"
(අ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම කුමක් ද?
(ආ) මෙහි 'ඔබ' යනුවෙන් අදහස් කළේ කවරෙක් ද?

(v) (අ) දීඝායු කුමාරයන්ගේ කතා වස්තුව උපුටා ගත් මුල් කෘතිය කුමක් ද?
(ආ) එම කතාව ලියැවී ඇත්තේ කුමන රචනා ශෛලියකින්ද?

(ලකුණු 2 × 5 = 10 යි.)

8 ශ්‍රේණිය

II වාර විභාගය -2019

අමතර කියවීම් පොත් ආශ්‍රයෙන් සකස් කරන ලද ප්‍රශ්න පත්‍රය

- පහත සඳහන් ප්‍රශ්න වලින් ප්‍රශ්න 2 ක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.

01. i. " කෝච්චියේ ළමයි"කෘතිය රචනා කළ කතුවරයාගේ නම කුමක් ද? ( ල. 1)

ii. " කෝච්චියේ ළමයි" කෘතියේ ඇතුළත් වන චරිත 2 ක් ලියන්න. ( ල. 1)

iii. " මොනවද? පුතාට ඕන"

ඉහත කියමන කවුරුන් විසින් කා හට, කුමන අවස්ථාවේදි පවසන ලද්දක ද? ( ල. 1)

02. i. " පොලියානා"කෘතිය රචනා කළ කතුවරයාගේ නම කුමක් ද? ( ල. 1)

ii. " පොලියානා" කෘතියේ ඇතුළත් වන චරිත 2 ක් ලියන්න. ( ල. 1)

iii. " පුංචි ගැහැණු ළමයෙක් මෙහේ එනවා" ( ල. 1)

ඉහත කියමන කවුරුන් විසින් කා හට කුමන අවස්ථාවේදී පවසන ලද්දක්ද? ( ල. 1)

03. i. ඔබට නියමිත උපමා කතා කෘතිය රචනා කළ රචකයාගේ නම ලියන්න. ( ල. 1)

ii. " කපුටා සහ දිය බඳුන" කතාවේ එන උපදේශය ලියන්න. ( ල. 1)

iii. " කරුණාකරලා මට යන්ඩ ඉඩ හරින්ඩ"

ඉහත ප්‍රකාශය කවුරුන් විසින් කාහට, කුමන අවස්ථාවේදී පවසන ලද්දක් ද? ( ල. 3)

04. i. අපේ ගමේ චිත්ති කෘතිය රචනා කළ රචකයාගේ නම ලියන්න. ( ල. 1)

Ii මෙම කතාවේ ඇතුළත් චරිත 2ක් ලියන්න. ( ල. 1)

iii. " නංගියේ හෙට කැට වලට හාල්පොතු දානන ඕනෑ"

ඉහත ප්‍රකාශය කවුරුන් විසින් කාහට, කුමන අවස්ථාවේදී පවසන ලද්දක් ද? ( ල. 3)

05. i. තොප්පි වෙළෙන්දා නාටකය රචනා කළේ කවුද? ( ල. 1)

Ii එම නාට්‍ය යේ එන චරිත 2ක් ලියන්න. ( ල. 1)

iii. " කීයද මේ තොප්පි?, ගණන් ද මේ තොප්පි"?

ඉහත ප්‍රකාශය කවුරුන් විසින් කාහට, කුමන අවස්ථාවේදී පවසන ලද්දක් ද? ( ල. 3)